කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2014

සැප්තැම්බර් - 2017

**BMGT E2065 - සංවිධාන න්‍යාය හා සැකැස්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : (08)

කාලය : පැය 03 යි

ප්‍රශ්න අංක 01 ට සහ වෙනත් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක - 01

**රාජ් රූපවාහිනී සමාගම**

රාජ් රූපවාහිනී සමාගම, රාජ් සමූහ ව්‍යාපාර ආයතනය යටතේ 1980 වසරේ දී පිහිට වූ ආයතනයකි. නිෂ්පාදන, මූල්‍ය, රක්ෂණ, ආදී විවිධ ක්ෂේත්‍රවල ප්‍රමුඛව කටයුතු කරන රාජ් සමූහ ව්‍යාපාරය, ජනතාව අතර දේශීය සංස්කෘතිය පදනම් කරගත් රූපවාහිනී වැඩ සටහන් විකාශනය කිරීම අරමුණු කරගෙන රාජ් රූපවාහිනී ආයතනය පිහිටුවන ලදි. ආරම්භයේ දී ප්‍රධාන නගර දෙකක් ආශ්‍රිතව තම විකාශණ කටයුතු ආරම්භ කරන ලද අතර රටේ ප්‍රධාන භාෂාව පදනම් කරගෙන එම රූපවාහිනී සේවාව ලබාදෙන ලදි. දේශීය සංස්කෘතිය මුල් කරගෙන තම රූපවාහිනී වැඩ සටහන් සකස් කිරීම සිදු කිරීම තුළ, ඉතා කෙටි කාලයක් තුළ එම ප්‍රධාන නගර දෙක ආශ්‍රිතව ප්‍රධාන රූපවාහිනී නාලිකාවක් බවට පත් වීමට රාජ් රූපවාහිනී ආයතනයට හැකිවිය.

මුල් කාලයේ මෙම සමාගමේ ප්‍රධානියා ලෙස කටයුතු කළේ මොහාන් රාජ් පවුලේ සාමාජිකයෙකු වූ රවි රාජ් මහතා වන අතර ඔහු යටතේ වැඩ සටහන් නිෂ්පාදන, වැඩ සටහන් ප්‍රවර්ධන, මූල්‍ය හා මානව සම්පත් කළමනාකරු වශයෙන් කළමනාකරුවන් හතරදෙනෙකු සහ ඔවුන් යටතේ විවිධ කාර්යයන් සඳහා 100 පමණ සේවක පිරිසක් මෙම ආයතනයේ සේවයේ නිරත විය. මනා විධිමත්කරණයක් සහ මධ්‍යගතකරණයක් සහිතව කටයුතු කළ මෙම සංවිධානය ක්‍රමයෙන් වර්ධනය වෙමින් කටයුතු කළේය.

2000 වසරේදී මෙම ආයතනය වැදගත් උපායමාර්ගික තීරණයක් ගනු ලැබීය. එනම්, රටේ අනෙකුත් ප්‍රදේශ අවරණය වන ලෙස තම රූපවාහිනී කටයුතු ව්‍යාප්ත කිරීමට තීරණය විය. ඒ අනුව රටේ පවතින ප්‍රධාන ප්‍රදේශ 10 ක් හඳුනාගන්නා ලද අතර ඒ අනුව, ප්‍රාදේශීය රූපවාහිනී නාලිකා 10 ක් දක්වා

තම කටයුතු විවිධාංගිකරණය කරන ලදි. කෙසේ වෙතත් එම ප්‍රාදේශීය නාලිකාවල කටයුතු තම ප්‍රධාන නාලිකා ආයතන වන රාජ් රූපවාහිනී සමාගම තුළින් කළමනාකරණය කිරීම හා මෙහෙයවීම සිදු කිරීමට සමාගම ප්‍රතිපත්ති තීරණයක් ගනු ලැබීය.

2005 වසර වන විට, රාජ් රූපවාහිනී සමාගමේ කටයුතු මෙන්ම, එහි ප්‍රාදේශීය රූපවාහිනී සමාගමේ කටයුතු ද විශාල ලෙස පුළුල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාදේශීය රූපවාහිනී වැඩ සටහන් සඳහා ප්‍රාදේශීය කළමනාකරුවන් 10 ගෙන ඒ ඒ ප්‍රාදේශීය කාර්යාලවල සේවය සඳහා සේවකයින් ද බඳවා ගන්නා ලදි. තව දුරටත්, රාජ් රූපවාහිනී නාලිකාවේ සාර්ථකත්වයට වැඩි දායකත්වයෙන් ප්‍රාදේශීය රූපවාහිනී නාලිකාවන් ලබාදුන් අතර, රාජ් රූපවාහිනී සමාගමේ ප්‍රධාන ලාභ උපයන මධ්‍යස්ථාන බවට පත්වීමට එම ප්‍රදේශීය ආයතනවලට හැකියාව ලැබී ඇත.

රාජ් රූපවාහිනී සමාගමේ වර්ථමානයේ සාර්ථකව කටයුතු සිදු වුවත්, එහි සංවිධාන ව්‍යුහය හා සැකැස්ම සම්බන්ධයෙන් අර්බුදකාරී තත්වයක් මතු වී ඇත. ප්‍රාදේශීය කාර්යාලවල කළමනාකරුවන් නිතරම පෙන්වා දෙන්නේ, තමන්ට ස්වාධීනව කටයුතු කිරීමේ අවස්ථාව සමාගම තුළ නොමැති බවයි. විශේෂයෙන් ඔවුන් විකාශනය කරන වැඩ සටහන් සඳහා, ප්‍රධාන ආයතනයෙන්, අනුමත කිරීමක් ලබා ගැනීමට සිදුවීම ගැටළුවක් බව ඔවුන් පෙන්වා දෙයි. එසේම, තම තීරණයන් සඳහා, ප්‍රධාන කාර්යාලවල කළමනාකරුවන් නිතර මැදිහත්වීම, තමන්ට ප්‍රදේශයේ අවශ්‍යතා අනුව වැඩ සටහන් සැකසීමට හා විකාශනයට බාදායක් බව ඔවුන් පෙන්වා දේ. එමෙන්ම තම වැඩ සටහන්වල සාර්ථකභාවය පිළිබඳ ගෞරවය ප්‍රධාන ආයතනයේ කළමනාකරුවන් ලබා ගැනීම පිළිබඳ ප්‍රදේශීය කළමනාකරුවන් නොසතුට නිතර ප්‍රකාශ කරයි.

තව දුරටත්, රාජ් රූපවාහිනී සමාගමේ කටයුතුවල වර්ධනය හා සංකීර්ණ බව හමුවේ, තවදුරටත් පවතින සංවිධාන ව්‍යුවහය මත කටයුතු කිරීම, සංවිධානයේ ඵලදායීත්වය අඩුවීමට හේතුවන බව පෙනී ගොස් ඇත. විශේෂයෙන්, සංවිධානයේ කටයුතු පිළිබඳ ප්‍රමිතකරණය හා විධිමත්කරණය ක්‍රමයෙන් අඩුවන බව පෙනීගොස් ඇති අතර, තිරණ ගැනීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී යම් පමාවක් සිදුවීමද දැකිය හැකිය.

ඉහත තත්වයන් හමුවේ, සමස්ථ සංවිධානයේ කටයුතු නැවත ප්‍රතිව්‍යුහගත කිරීම සිදුකළ යුතු බව ඉහළ කළමනාකරණයේ අදහස වී ඇත. ඒ අනුව රූපවාහිනී සමාගම තම කටයුතු ප්‍රති ව්‍යුහගත කිරීම පිළිබඳ වර්ථමානයේ සලකා බලමින් සිටියි.

මෙය මනඃකල්පිත සිද්ධියකි.

(අ) රාජ් රූපවාහිනී සමාගම වර්ථමානයේ මුහුණ දී ඇති ව්‍යුහාත්මක ගැටළු මොනවාදැයි, සංවිධාන න්‍යාය හා සැකැස්ම පිළිබඳ න්‍යායාත්මක කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 14)

(ආ) මෙම සමාගම මුහුණ දී ඇති ව්‍යුහාත්මක ගැටළු, විසඳීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ව්‍යුහාත්මක යෝජනා හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 14)

**(මුළු ලකුණු 28)**

ප්‍රශ්න අංක - 02

(අ) සංවිධාන පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා වන මූලික ප්‍රවේශයන් දක්වා, ඉන් එක් ප්‍රවේශයක් (Perspective of Organization) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) සංවිධාන න්‍යාය හා සැකැස්ම (Organizational Theory and Design) විකාශනයෙහිලා, සමාජ ප්‍රවේශය යටතේ (Social Perspective) වන මූලික දායකත්වයන් අගයන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක - 03

(අ) සංවිධාන පරිසරය විග්‍රහ කිරීම සම්බන්ධයෙන් එමරි හා ට්‍රිස්ට් (1965) ඉදිරිපත් කර ඇති පරිසර වර්ගීකරණය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) සංවිධාන ව්‍යුහයේ මානයක් ලෙස විධිමත්කරණය (Formalization) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න නිර්වචනය කර, එහි වන කළමනාකරණ බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක - 04

(අ) හෙන්රි මින්ට්ස්බර්ග්ට අනුව, සංවිධානයක ව්‍යුහය තීරණය කිරීමෙහිලා වැදගත් වන ප්‍රධාන සංවිධාන පාර්ශයන් උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) ආංශික ව්‍යුහය (Divisional Structure) යන්න පැහැදිලි කොට, එය යොදා ගත හැකි අවස්ථා ප්‍රයෝගික උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක - 05

(අ) දැනුම පාදක තාක්ෂණය (Knowledge Based echnology) යනු කුමක්ද? එය සංවිධාන ව්‍යුහය කෙරෙහි බලපාන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) සංවිධාන උපාය මාර්ග (strategies) සහ සංවිධාන ව්‍යුහය අතර වන සම්බන්ධතාවය උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක - 06

(අ) අන්තර් ජාතික සංවිධානවල ව්‍යුහය හා සම්බන්ධ වූ ගෝලීය ප්‍රමිතකරණය (Global Standardization) සහ දේශීය ප්‍රතිචාරශීලීත්වය (Local Responsiveness) යනු, කුමක්දැයි විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) සංවිධාන ව්‍යුහය ගලපා ගැනීම සඳහා ආයතනයන් ට අනුගමනය කළ හැකි ප්‍රධාන ව්‍යුහාත්මක උපක්‍රම මොනවාදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක - 07

(අ) සංවිධාන ඵලදායීත්වය (Organizational Effectiveness) යන්න නිර්වචනය කර, එය ඇගයීම සඳහා වන මූලික ප්‍රවේශයක් විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) සංවිධාන ප්‍රමාණය (Organizational Size) හා සංවිධාන ව්‍යුහය අතර වන සම්බන්ධතාවය සුදුසු උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක - 08

පහත සඳහන් මාතෘකා අතරින්, මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) සංවිධාන වෙනස්වීම හා ව්‍යුහය

(ආ) සංවිධාන සංස්කෘතිය හා ව්‍යුහය

(ඇ) සංවිධාන ගැටුම් හා සංවිධාන සැකැස්ම

(ඉ) අන්තර් ජාතික සංවිධානවල සම්බන්ධීකරණ උපාය මාර්ග

(ලකුණු **6 x 3 =18)**